# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 14,310 — 1965 ජනවාරි 30 වැනි සෙනසුරාද — 1965.1.30

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදි.)


# IV වැනි කොටස—පළාත් පාලනය

## පළාත් පාලන සහ ඡන්ද ආඥපනත යටතේ දැන්වීම්

ඇල්.ඞී.—බී. 74/39

### ගම්සභා ආඥපනත

1961 අංක 60 දරන පණතින් සංශෝධිත (257 වැනි අධිකාරය වන) ගම් සභා ආඥපනතේ 5 (2) වැනි වගන්තියෙන් තමා කෙරෙහි පැවරී ඇති බලතල ප්‍රකාර පළාත් පාලනය හා ස්වදේශ කටයුතු පිළිබඳ ඇමතිවරයා විසින් පනවන ලද ආඥාවයි.

ඒ. පී. ජයසූරිය,
පළාත් පාලනය හා ස්වදේශ කටයුතු පිළිබඳ ඇමති.

1965 ජනවාරි මස 29 වැනි දින,
කොළඹ දීය.

### ආඥාව

දකුණු පළාතේ මාතර දිස්ත්‍රික්කයේ වැලිගම් කෝරළයේ ප්‍රාදේශීය ආදායම් නිලධරයාගේ කොට්ඨාශයේ අකුරැස්ස ගම් ප්‍රදේශය නැවත බෙදා වෙන් කිරීමට අදාලව පනවනු ලැබ 1964 ජූනි මස 27 වැනි දින අංක 14,083 දරන ගැසට් පත්‍රයේ පළ කරණලද ආඥාවේ සඳහන් බෙදා වෙන් කිරීම ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කරුණු සඳහා මෙහි වූ උපලේඛනයේ දැක්වෙන ආකාරයෙන් මෙයින් විධි විධාන සලස්වනු ලැබේ.

### උපලේඛනය

එක් එක් අළුත් ගම් ප්‍රදේශයේ ගම්සභාව, එකී අළුත් ගම් ප්‍රදේශයට අදාල විය හැකි ගම්සභා ආඥාපනතේ සියලුම කාර්යයන් සඳහා පැරණි ගම් ප්‍රදේශයේ ගම් සභාවේ අනුප්‍රාප්තිකයා විය යුතුය.

2. පැරණි ගම් ප්‍රදේශයේ ගම්සභාව විසින් සම්පාදිතව 1965 ජනවාරි මස 31 වැනි දින දී වලංගුව පවත්නා සියලුම අතුරු ව්‍යවස්ථා, එක් එක් අළුත් ගම් සභාවට අදාළ වන ප්‍රමාණයට එකී එක් එක් අළුත් ගම් ප්‍රදේශයේ වලංගුව පැවතිය යුතු අතර, එකී අතුරු ව්‍යවස්ථා එකී අළුත් ගම් ප්‍රදේශයේ ගම්සභාව විසින් සම්පාදිත ලෙස සැලකිය යුතුය.

3. 1965 ජනවාරි මස 31 වැනි දින දී පැරණි ගම් ප්‍රදේශයේ ගම් සභාව කෙරෙහි පැවරී තිබෙන හෝ එහි පාලනය යටතේ පවතින පහත සඳහන් චංචල දේපල, 1965 පෙබරවාරි මස 1 වැනි දින සිට මාරඹ අළුත් ගම් ප්‍රදේශයේ ගම් සභාව කෙරෙහි පවරන ලද ලෙස සැලකිය යුතු අතර පැරණි ගම් ප්‍රදේශයේ ගම්සභාවේ ඉතිරි චංචල දේපල කනංකෙ අළුත් ගම් ප්‍රදේශයේ ගම් සභාව කෙරෙහි පවරන ලද ලෙස සැලකිය යුතුය.

| | | | |
|---|---|---|---|
| අත් කරත්ත | ... | ... | 1 යි |
| පුටු | ... | ... | 12 යි |
| අල්මාරි | ... | ... | 2 යි |
| මේස | ... | ... | 4 යි |
| බංකු | ... | ... | 1 යි |
| තට්ටු | ... | ... | 4 යි |
| දැන්වීම් පුවරු | ... | ... | 1 යි |
| තීන්ත කුඩු | ... | ... | 2 යි |
| මේස රෙදි | ... | ... | 1 යි |
| රාක්ක | ... | ... | 1 යි |
| ඉංග්‍රීසි ටයිප්රයිටර් | ... | ... | 1 යි |
| සීනුව හා භාණ්ඩ වාහකය සහිත රැලේ බයිසිකල් | ... | ... | 1 යි |
| පයිල් කැබිනෙට්ටු | ... | ... | 1 යි |
| පොත් රාක්ක | ... | ... | 1 යි |
| කොඩි | ... | ... | 1 යි |
| කඩදාසි බර | ... | ... | 4 යි |
| සිදුරුකිරීමේ යන්ත්‍ර | ... | ... | 1 යි |

මාරඹ අලුත් ගම් ප්‍රදේශයට අසුවන මාරඹ සහ මලිදුව මාතෘදාරකාභිවෘද්ධි චිකිත්සාගාරවල ඇති සියලුම චංචල දේපල එම අලුත් ගම් සභා ප්‍රදේශය කෙරෙහි පැවරිය යුතු අතර කනංකෙ මාතෘදාරකාභිවෘද්ධි චිකිත්සාගාරයේ ඇති සියලුම චංචල දේපල කනංකෙ අලුත් ගම්සභා ප්‍රදේශය කෙරෙහි පැවරිය යුතුය.

4. 1965 ජනවාරි මස 31 වැනි දින දී පැරණි ගම් ප්‍රදේශයේ ගම් සභාව කෙරෙහි පැවරී තිබෙන හෝ එහි පාලනය යටතේ පවතින එක් එක් ඉඩම, ගොඩනැගිල්ල හෝ වෙනත් නිශ්චල දේපළ, එකී ඉඩම, ගොඩනැගිල්ල හෝ වෙනත් නිශ්චල දේපල පිහිටා තිබෙන අළුත් ගම් ප්‍රදේශයේ ගම්සභාව කෙරෙහි 1965 පෙබරවාරි මස 1 වැනි දින සිට පැවරී ඇති ලෙස සැලකිය යුතුය.

5. පැරණි ගම් ප්‍රදේශයේ ගම්සභාවේ සියලුම අයිතිවාසිකම්, ණය තුරුස්, බැරකම් හා බැඳීම්, ඒවා එක් එක් අලුත් ගම් ප්‍රදේශයේ ගම්සභාවට අදාල වන ප්‍රමාණයට, 1965 පෙබරවාරි මස 1 වැනි දින සිට එකී අලුත් ගම් ප්‍රදේශයේ ගම් සභාවට මාරු කරණු ලැබූ ලෙස සැලකිය යුතුය.

6. පැරණි ගම් ප්‍රදේශයේ ගම් සභා කාර්යාලයේ පවත්වා ගෙන යනු ලැබූ සියලුම ලිපිගොනු හා ලේඛන ඒවා එක් එක් අලුත් ගම් ප්‍රදේශයට අදාල වන ප්‍රමාණයට, 1965 පෙබරවාරි මස 1 වැනි දින සිට එකී අලුත් ගම් ප්‍රදේශයේ ගම් සභා කාර්යාලයට මාරු කරණු ලැබූ ලෙස සැලකිය යුතුය.

7. පැරණි ගම් සභාවේ සේවයේ නියුක්තව සිටි හා දැනට නියුක්තව සිටින සේවකයින්ට විශ්‍රාම වැටුප් ගෙවීම පිණිස වූ දායක මුදල් ගෙවීම පිළිබඳ බැරකම් පහත සඳහන් ආකාරයෙන් බෙදිය යුතුය :—

(අ) පැරණි ගම් සභාව විසින් දැනට ගෙවනු ලබන විශ්‍රාම වැටුප් සම්බන්ධයෙන් කනංකෙ හා මාරඹ අලුත් ගම්සභා අතර 1 : 1 අනුපාතයෙන් ;

(ආ) පැරණි ගම් සභාවේ කලින් සේවය කොට දැනට පිටතට මාරු කර ඇති සේවකයින්ට ගෙවිය යුතු විශ්‍රාම වැටුප් සම්බන්ධයෙන් කනංකෙ හා මාරඹ අලුත් ගම්සභා අතර 1 : 1 අනුපාතයෙන් ;

(ඇ) පැරණි ගම් සභාවේ දැනට සේවයේ නියුක්තව සිටින සේවකයින්ගේ විශ්‍රාම වැටුප් සම්බන්ධයෙන් කතාංකෙ හා මාරඹ අලුත් ගම්සභා අතර 1 : 1 අනුපාතයෙන්.

8. මෙම උපලේඛනයේ—

(අ) අන්ලෙසකින් සඳහන් කරනු නොලැබුවහොත් "අලුත් ගම් ප්‍රදේශය" යන්නෙන් 1964 ජූනි මස 27 වැනි දින අංක 14,083 දරන ගැසට් පත්‍රයේ පළ කරණලද ආඥාවෙහි වූ උපලේඛනයෙහි විස්තර කර ඇති කතාංකෙ ගම් ප්‍රදේශය හෝ මාරඹ ගම් ප්‍රදේශය අදහස් වේ.

(ආ) "පැරණි ගම් ප්‍රදේශය" යන්නෙන් අලුත් ගම් ප්‍රදේශ ඇතිවීමට පෙර පැවති අකුරැස්ස ගම් සභාවේ ගම් ප්‍රදේශය අදහස් වේ.

---

ඇල්.ඩී.—බී. 74/39

## ගම්සභා ආඥාපනත

1961 අංක 60 දරන පනතින් සංශෝධිත (257 වැනි අධිකාරය වන) ගම් සභා ආඥාපනතේ 5 (2) වැනි වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර පළාත් පාලනය හා සවදේශ කටයුතු පිළිබඳ ඇමතිවරයා විසින් පනවන ලද ආඥාවයි.

ඒ. පී. ජයසූරිය,
පළාත් පාලනය හා සවදේශ කටයුතු පිළිබඳ ඇමති.

1965 ජනවාරි මස 29 වැනි දින,
කොළඹ දීය.

### ආඥාව

දකුණු පළාතේ මාතර දිස්ත්‍රික්කයේ වැලිගම් කෝරළයේ ප්‍රාදේශීය ආදායම් නිලධරයාගේ කොට්ඨාශයේ වැලිගම ගම් ප්‍රදේශය වෙනස් කිරීම සහ නැවත විස්තර කිරීම සම්බන්ධයෙන් අදාලව 1964 ජූලි මස 31 වැනි දින අංක 14,126 දරන ගැසට් පත්‍රයේ පළකරන ලද ආඥාවේ සඳහන් බෙදීම ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කරුණු සඳහා මෙහි වූ උපලේඛනයේ දැක්වෙන ආකාරයෙන් මෙයින් විධිවිධාන සලස් වනු ලැබේ.

### උපලේඛනය

එක් එක් අලුත් ගම් ප්‍රදේශයේ ගම් සභාව, එකී අළුත් ගම් ප්‍රදේශයට අදාල විය හැකි ගම් සභා ආඥාපනතේ සියලුම කාර්යයන් සඳහා පැරණි ගම් ප්‍රදේශයේ ගම් සභාවේ අනුප්‍රාප්තිකයා විය යුතුය.

2. පැරණි ගම් ප්‍රදේශයේ ගම් සභාව විසින් සම්පාදිතව 1965 ජනවාරි මස 31 වැනි දින දී වලංගුව පවත්නා සියලුම අතුරු ව්‍යවස්ථා, එක් එක් අලුත් ගම් ප්‍රදේශයට අදාළ වනා ප්‍රමාණයට එකී එක් එක් අලුත් ගම් ප්‍රදේශයේ වලංගුව පැවතිය යුතු අතර, එකී අතුරු ව්‍යවස්ථා, එකී අලුත් ගම් ප්‍රදේශයේ ගම් සභාව විසින් සම්පාදිත ලෙස සැලකිය යුතුය.

3. 1965 ජනවාරි මස 31 වැනි දින දී පැරණි ගම් ප්‍රදේශයේ ගම් සභාව කෙරෙහි පැවරී තිබෙන හෝ එහි පාලනය යටතේ පවතින පහත සඳහන් චංචල දේපළ, 1965 පෙබරවාරි මස 1 වැනි දින සිට මිරිස්ස අලුත් ගම් ප්‍රදේශයේ ගම් සභාව කෙරෙහි පවරනලද ලෙස සැලකිය යුතු අතර, පැරණි ගම් ප්‍රදේශයේ ගම් සභාවේ ඉතිරි චංචල දේපළ වැලිගම අලුත් ගම් ප්‍රදේශයේ ගම් සභාව කෙරෙහි පවරන ලද ලෙස සැලකිය යුතුය.

| | | |
|---|---|---|
| පුටු | ... | 16 යි. |
| ලොකු මේස | ... | 1 යි. |
| ලියන මේස | ... | 1 යි. |
| අල්මාරි | ... | 2 යි. |
| ලී පෙට්ටි | ... | 1 යි. |
| බංකු | ... | 1 යි. |
| තට්ටු | ... | 1 යි. |
| පසිලින් කැබිනට්ටු | ... | 1 යි. |
| (ඉංග්‍රීසි) ටයිප්රයිටර් | ... | 1 යි. |
| (සිංහල ඔලිම්පියා) ටයිප්රයිටර් | ... | 1 යි. |
| ටේප් | ... | 1 යි. |
| ගෙස්ටෙට්නර් පිටපත්කිරීමේ යන්ත්‍ර | ... | 1 යි. |
| සිංහ කොඩි | ... | 1 යි. |
| තීන්ත කුඩු | ... | 1 යි. |
| කඩදාසි බරු | ... | 1 යි. |
| බැම්පර් | ... | 1 යි. |
| සීනු | ... | 1 යි. |
| තීන්ත පෑඩ් | ... | 1 යි. |
| උදලු | ... | 5 යි. |
| අලවංගු | ... | 3 යි. |
| කැති | ... | 1 යි. |
| මීටි | ... | 1 යි. |
| මුල්ලු | ... | 1 යි. |
| පොරව | ... | 1 යි. |
| රේක්ක | ... | 1 යි. |
| අත් පොරව | ... | 1 යි. |
| තාච්චි | ... | 6 යි. |
| බාල්දි | ... | 2 යි. |
| වැසිකිලි බාල්දි | ... | 7 යි. |
| ස්ටොක් බකට් | ... | 5 යි. |

මිරිස්ස අලුත් ගම් ප්‍රදේශයට අසුවන මිරිස්ස, කොටවිල, තල්අරඹ සහ කඹුරුගමුවේ මාතෘදරකාභිවෘද්ධි චිකිත්සාගාරවල ඇති සියලුම චංචල දේපල එම ගම් සභා ප්‍රදේශය කෙරෙහි පැවරිය යුතු අතර වැලිගම අලුත් ගම් ප්‍රදේශයට අසුවන දෙනිපිටිය හා මූදුගමුව මාතෘදාරකාභිවෘද්ධි චිකිත්සාගාරවල ඇති සියලුම චංචල දේපල එම ගම් ප්‍රදේශය කෙරෙහි පැවරිය යුතුය.

4. 1965 ජනවාරි මස 31 වැනි දින දී පැරණි ගම් ප්‍රදේශයේ ගම් සභාව කෙරෙහි පැවරී තිබෙන හෝ එහි පාලනය යටතේ පවතින එක් එක් ඉඩම් ගොඩනැගිල්ල හෝ වෙනත් නිශ්චල දේපල එකී ඉඩම, ගොඩනැගිල්ල හෝ වෙනත් නිශ්චල දේපළ පිහිටා තිබෙන අලුත් ගම් ප්‍රදේශයේ ගම් සභාව කෙරෙහි 1965 පෙබරවාරි මස 1 වැනි දින සිට පැවරී ඇති ලෙස සැලකිය යුතුය.

5. පැරණි ගම් ප්‍රදේශයේ ගම් සභාවේ සියලුම අයිතිවාසිකම්, ණය තුරුස් බැරකම් හා බැඳීම්, ඒවා එක් එක් අලුත් ගම් ප්‍රදේශයේ ගම් සභාවලට අදාල වන ප්‍රමාණයට, 1965 පෙබරවාරි මස 1 වැනි දිනයේ සිට එකී අලුත් ගම් ප්‍රදේශයේ ගම් සභාවට මාරුකරනු ලැබූ ලෙස සැලකිය යුතුය.

6. පැරණි ගම් ප්‍රදේශයේ ගම් සභා කාර්යාලයේ පවත්වාගෙන යනු ලැබූ සියලුම ලිපි ගොනු හා ලේඛන ඒවා එක් එක් අලුත් ගම් ප්‍රදේශයට අදාල වන ප්‍රමාණයට, 1965 පෙබරවාරි මස 1 වැනි දින සිට එකී අලුත් ගම් ප්‍රදේශයේ ගම් සභා කාර්යාලයට මාරු කරණු ලැබූ ලෙස සැලකිය යුතුය.

7. පැරණි ගම් සභාවේ සේවයේ නියුක්තව සිටි හා දැනට නියුක්තව සිටින සේවකයින්ට විශ්‍රාම වැටුප් ගෙවීම පිණිස වූ දැයක මුදල් ගෙවීම පිළිබඳ බැරකම් පහත සඳහන් ආකාරයෙන් බෙදිය යුතුය :—

(අ) පැරණි ගම් සභාව විසින් දැනට ගෙවනු ලබන විශ්‍රාම වැටුප් සම්බන්ධයෙන් මිරිස්ස හා වැලිගම අලුත් ගම් සභා අතර 1 : 1 අනුපාතයෙන් ;

(ආ) පැරණි ගම් සභාවේ කලින් සේවය කොට දැනට පිටතට මාරු කර ඇති සේවකයින්ට ගෙවිය යුතු විශ්‍රාම වැටුප් සම්බන්ධයෙන් මිරිස්ස හා වැලිගම අලුත් ගම් සභා අතර 1 : 1 අනුපාතයෙන් ;

(ඇ) පැරණි ගම් සභාවේ දැනට සේවයේ නියුක්තව සිටින සේවකයින්ගේ විශ්‍රාම වැටුප් සම්බන්ධයෙන් මිරිස්ස හා වැලිගම අලුත් ගම් සභා අතර 1 : 1 අනුපාතයෙන්.

8. මෙම උපලේඛනයේ—

(අ) අන් ලෙසකින් සඳහන් කරනු නොලැබුවහොත් වෙනත් අන්දමින් සඳහන් කලොත් මිස "අලුත් ගම් ප්‍රදේශය" යන්නෙන් 1964 ජූලි මස 31 වැනි දින අංක 14.126 දරන ගැසැට් පත්‍රයේ පළ කරන ලද ආඥාවෙන් වෙනස්කර නැවත විස්තර කරන ලද මිරිස්ස ගම් ප්‍රදේශය හෝ වැලිගම ගම් ප්‍රදේශය අදහස් වේ.

(ආ) "පැරණි ගම් ප්‍රදේශය" යන්නෙන් අලුත් ගම් ප්‍රදේශ ඇතිවීමට පෙර පැවති වැලිගම ගම් සභාවේ ගම් ප්‍රදේශය අදහස් වේ.

---

## ගම් සභා ආඥාපනත

1961 අංක 60 දරණ පනතින් සංශෝධිත (257 වන අධිකාරය වන) ගම් සභා ආඥාපනතේ 5 (2) වැනි වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර පළාත් පාලනය හා ස්වදේශ කටයුතු පිළිබඳ ඇමතිවරයා විසින් පනවන ලද ආඥාව.

ඒ. පී. ජයසූරිය,
පළාත් පාලනය හා ස්වදේශ කටයුතු පිළිබඳ ඇමති.

1965 ජනවාරි මස 29 වැනි දින,
කොළඹ දී ය.

### ආඥාව

දකුණු පළාතේ මාතර දිස්ත්‍රික්කයේ වැල්ලබඩ පත්තුවේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ දෙවිනුවර ගම් ප්‍රදේශය නැවත බෙදා වෙන් කිරීමට අදාලව 1964 ජූලි 17 වැනි දින අංක 14,108 දරන ගැසට් පත්‍රයේ පළකරනලද ආඥාවේ සඳහන් බෙදා වෙන් කිරීම ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කරුණු සඳහා, මීට යාකොට ඇති උපලේඛනයේ දැක්වෙන ආකාරයෙන් විධිවිධාන මෙයින් සලස්වනු ලැබේ.

## උපලේඛනය

එක් එක් අලුත් ගම් ප්‍රදේශයේ ගම් සභාව, එකී අලුත් ගම් ප්‍රදේශයට අදාළ විය හැකි පරිදි ගම්සභා ආඥාපනතේ කාර්‍යයන් සඳහා පැරණි ගම් ප්‍රදේශයේ ගම් සභාවේ අනුප්‍රාප්තික සභාව විය යුතුය.

2. පැරණි ගම් ප්‍රදේශයේ ගම් සභාව විසින් සම්පාදිත 1965 ජනවාරි 31 වැනි දින. වනතෙක් වලංගුව. පවත්නා සියළුම අතුරු ව්‍යවස්ථා ඒ අලුත් ගම් සභාවට අදාළවන ප්‍රමාණයට ඒ එක් එක් අලුත් ගම් ප්‍රදේශයේ වලංගුව පැවතිය යුතු අතර ඒ අතුරු ව්‍යවස්ථා, ඒ අලුත් ගම් ප්‍රදේශයේ ගම් සභාව විසින් සම්පාදිත ලෙස සැලකිය යුතුය.

3. (අ) 1965 ජනවාරි 31 වැනිදාට, පැරණි ගම් ප්‍රදේශයේ ගම් සභාව කෙරෙහි පැවරී තිබෙන හෝ එහි පාලනය යටතේ පවතින පහත සඳහන් චංචල දේපළ, 1965 පෙබරවාරි 1 වැනි දින සිට කෝට්ටගොඩ අලුත් ගම් ප්‍රදේශයේ ගම් සභාව කෙරෙහි පැවරෙන ලෙස සැලකිය යුතු අතර, පැරණි ගම් ප්‍රදේශයේ ගම් සභාවේ ඉතිරි චංචල දේපළ, ගන්දර අලුත් ගම් ප්‍රදේශයේ ගම් සභාව කෙරෙහි පැවරෙන ලෙස සැලකිය යුතුය.

| | | |
|---|---|---|
| යතුරු ලියන මේස | ... | 1 යි. |
| ස්ටූල් | ... | 1 යි. |
| ඇඳි පුටු | ... | 14 යි. |
| කඩදාසි බන්දේසි | ... | 3 යි. |
| කාඩ් රැක් | ... | 1 යි. |
| අල්මාරි | ... | 1 යි. |
| සිතියම් | ... | 2 යි. |
| කඩදාසි බර | ... | 2 යි. |
| පන්චර් | ... | 1 යි. |
| කරත්ත (කසල ශෝධක) | ... | 1 යි. |
| උදළු | ... | 3 යි. |
| අලවංගු | ... | 1 යි. |
| කැති | ... | 1 යි. |
| බාල්දි | ... | 3 යි. |
| පෙන්සම් පෙට්ටි | ... | 1 යි. |
| සිංහ කොඩි | ... | 2 යි. |
| ගෙස්ටෙට්නර් පිටපත් යන්ත්‍ර | ... | 1 යි. |
| වානේ කැබිනට් | ... | 1 යි. |
| මේස | ... | 2 යි. |

(ආ) කෝට්ටගොඩ අලුත් ගම් ප්‍රදේශයේ කෝට්ටගොඩ පිහිටුවා ඇති ආයුර්වේද බෙහෙත් ශාලාවේ ඇති සියළුම චංචල දේපල ඒ ගම්සභා ප්‍රදේශයේ ගම්සභාව කෙරෙහි පැවරිය යුතුය.

(ඇ) ගන්දර අලුත් ගම් ප්‍රදේශයේ ගන්දර පිහිටුවා ඇති මාතෘ දාරකාභිවෘද්ධි චිකිත්සාගරයේ ඇති සියළුම චංචල දේපල එම අලුත් ගම්සභා ප්‍රදේශයේ ගම් සභාව කෙරෙහි පැවරිය යුතුය.

4. පැරණි ගම් ප්‍රදේශයේ ගම් සභාව කෙරෙහි 1965 ජනවාරි මස 31 වන දින පැවරී තිබෙන හෝ එහි පාලනය යටතේ පවතින එක් එක් ඉඩම, ගොඩනැගිල්ල හෝ අනිකුත් නිශ්චල දේපල, ඒ ඉඩම, ගොඩනැගිල්ල හෝ අනිකුත් නිශ්චල දේපල පිහිටා තිබෙන අලුත් ගම් ප්‍රදේශයේ ගම් සභාව කෙරෙහි 1965 පෙබරවාරි 1 වන දින සිට පැවරී ඇති ලෙස සැලකිය යුතුය.

5. පැරණි ගම් ප්‍රදේශයේ ගම්සභාවේ සියළුම අයිතිවාසිකම්, ණය තුරුස්, වගකීම් හා බැඳීම් එක් එක් අලුත් ගම් ප්‍රදේශයේ ගම් සභාවට අදාළවන ප්‍රමාණයට ඒවා 1965 පෙබරවාරි 1 වන දින සිට ඒ අලුත් ගම් ප්‍රදේශයේ ගම්සභාවට මාරු කරනු ලැබූ ලෙස සැලකිය යුතුය.

6. පැරණි ගම් ප්‍රදේශයේ ගම්සභා කාර්‍යාලයේ පවත්වාගෙන යනු ලැබූ සියළුම ලිපිගොනු හා ලේඛන, ඒවා එක් එක් අලුත් ගම් ප්‍රදේශයට අදාළ ප්‍රමාණයට 1965 පෙබරවාරි 1 වන දින සිට ඒ අලුත් ගම් ප්‍රදේශයේ ගම්සභා කාර්‍යාලයට මාරු කරනු ලැබූ ලෙස සැලකිය යුතුය.

7. පැරණි ගම් සභාවේ සේවයේ නියුක්තව සිටියාවූද දැනට සිටින්නාවූද සේවකයින්ට විශ්‍රාම වැටුප් පිණිස වූ දායක මුදල් ගෙවීම පිළිබඳව ඊට ඇති වගකීම් පහත සඳහන් ආකාරයෙන් බෙදිය යුතුය :—

(අ) පැරණි ගම් සභාව විසින් දැනට ගෙවනු ලබන විශ්‍රාම වැටුප් සම්බන්ධයෙන් ගන්දර හා කෝට්ටගොඩ යන අලුත් ගම් සභා අතරේ 1 : 1 සමානුපාතයෙන්.

(ආ) පැරණි ගම් සභාවේ කලින් සේවය කොට දැනට පිටතට මාරු කර ඇත්තාවූ සේවකයින්ට ගෙවිය යුතු විශ්‍රාම වැටුප් සම්බන්ධයෙන් ගන්දර හා කෝට්ටගොඩ යන අලුත් ගම්සභා අතරේ 1 : 1 සමානුපාතයෙන්.

(ඇ) පැරණි ගම් සභාවේ දැනට සේවයේ නියුක්තව සිටින්නාවූ සේවකයින්ගේ විශ්‍රාම වැටුප් සම්බන්ධයෙන් ගන්දර හා කෝට්ට ගොඩ යන අලුත් ගම් සභා අතරේ 1 : 1 සමානුපාතයෙන්.

8. මේ උපලේඛනයේ—

(අ) වෙනත් අන්දමකින් සඳහන් කළහොත් මිස "අලුත් ගම් ප්‍රදේශය" යනුවෙන් 1964 ජූලි 17 වන දින අංක 14,108 දරන ගැසට් පත්‍රයේ පලකරනලද ආඥාවට යාකරන ලද උප ලේඛනයේ විස්තර කර ඇති ගන්දර ගම් ප්‍රදේශය හෝ කෝට්ටගොඩ ගම් ප්‍රදේශය අදහස් කරනු ලැබේ.

(ආ) "පැරණි ගම් ප්‍රදේශය" යනුවෙන් අලුත් ගම් ප්‍රදේශය ඇති කිරීමට පෙර පැවති දෙවිනුවර ගම් ප්‍රදේශය අදහස් කරනු ලැබේ.

---

ඇල්. ඩී.—බී 74/39

## ගම්සභා ආඥාපනත

1961 අංක 60 දරන පනතින් සංශෝධිත (257 වැනි අධිකාරය වන) ගම් සභා ආඥාපනතේ 5 (2) වැනි වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, පළාත් පාලනය හා ස්වදේශ කටයුතු පිළිබඳ ඇමතිවරයා විසින් පනවන ලද ආඥාව.

ඒ. පී. ජයසූරිය,
පළාත් පාලනය හා ස්වදේශ කටයුතු පිළිබඳ ඇමති.

1965 ජනවාරි මස 29 වැනි දින,
කොළඹ දීය.

### ආඥාව

දකුණු පළාතේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ උතුරු ගිරුවා පත්තුවේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ කිරම ගම් ප්‍රදේශය වෙනස් කර නැවත විස්තර කිරීමට අදාලව පනවනු ලැබ, 1964 ජූනි මස 18 වැනි දින අංක 14,068 දරන ගැසට් පත්‍රයේ පළ කරනලද ආඥාවෙහි සඳහන් බෙදීම ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කරුණු සඳහා මීට යාකොට ඇති උපලේඛනයෙහි දක්වෙන ආකාරයෙන් විධිවිධාන මෙයින් සලස්වනු ලැබේ.

## උපලේඛනය

1. අළුත් ගම් ප්‍රදේශයේ ගම් සභාව, එකී අළුත් ගම් ප්‍රදේශයට අදාළ විය හැකි ගම් සභා ආඥාපනතේ කාර්‍යයන් සඳහා පැරණි ගම් ප්‍රදේශයේ ගම් සභාවේ අනුප්‍රාප්තිකයා විය යුතුය.

2. පැරණි ගම් ප්‍රදේශයේ ගම් සභව විසින් සම්පාදිතව 1965 ජනවාරි මස 31 වැනි දිනට වලංගුව පවත්නා සියලුම අතුරු ව්‍යවස්ථා එකී අළුත් ගම් සභවට අදාළවන ප්‍රමණයට එකී අළුත් ගම් ප්‍රදේශයෙහි වලංගුව පැවතිය යුතු අතර, එකී අතුරු ව්‍යවස්ථා එකී අළුත් ගම් ප්‍රදේශයේ ගම් සභාව විසින් සම්පාදිතව ඇතැයි සැලකිය යුතුය.

3. 1965 ජනවාරි 31 වැනි දිනට පැරණි ගම් ප්‍රදේශයේ ගම් සභාව වෙත පැවරී තිබෙන හෝ එහි පාලනය යටතේ පවතින එක් එක් ඉඩම, ගොඩනැගිල්ල හෝ අනිකුත් නිශ්චල දේපළ, ඒ ඉඩම, ගොඩනැගිල්ල හෝ අනිකුත් නිශ්චල දේපළ පිහිටා තිබෙන අළුත් ගම් ප්‍රදේශයේ ගම් සභාව වෙත 1965 ජනවාරි මස 1 වන දින සිට පැවරී ඇති ලෙස සැලකිය යුතුය.

4. පැරණි ගම් ප්‍රදේශයේ ගම් සභාවේ සියලුම අයිතිවාසිකම්, ණය තුරුස්, බැරකම් හා බැඳීම් අලුත් ගම් ප්‍රදේශයට අදාළ වන ප්‍රමාණයට 1965 පෙබරවාරි මස 1 වන දින සිට එකී අලුත් ගම් ප්‍රදේශයේ ගම් සභාවට පවරනු ලැබූ ලෙස සැලකිය යුතුය.

5. මෙම උපලේඛනයෙහි—

(අ) වෙනත් අන්දමකින් සඳහන් නොකරනු ලැබුවහොත් "අලුත්ගම් ප්‍රදේශය" යනුවෙන්, 1964 ජූනි මස 18 වැනි දින අංක 14,068 දරන ගැසට් පත්‍රයෙහි පළ කරන ලද ආඥාවෙන් විස්තර කර ඇති කිරම ගම් ප්‍රදේශය අදහස් වේ.

(ආ) අලුත් ගම් ප්‍රදේශය සංස්ථාපනය කරනු ලැබීමට පෙර පැවති කිරම ගම් ප්‍රදේශය "පැරණි ගම් ප්‍රදේශය" යනුවෙන් අදහස් වේ.

ඇල්. ඩී—බී 74/39

## ගම්සභා ආඥපනත

1961 අංක 60 දරන පනතින් සංශෝධිත (257 වැනි අධිකාරය වන) ගම් සභා ආඥපනතේ 5 (2) වැනි වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, පළාත් පාලනය හා සවදේශ කටයුතු පිළිබඳ ඇමතිවරයා විසින් පනවන ලද ආඥව.

ඒ. පී. ජයසූරිය,
පළාත් පාලනය හා ස්වදේශ කටයුතු පිළිබඳ ඇමති.

1965 ජනවාරි මස 29 වැනි දින,
කොළඹ දීය.

### ආඥව

දකුණු පළාතේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ නැගෙනහිර ගිරුවා පත්තුවේ ප්‍රාදේශීය. ආදායම් නිලධාරි කොට්ඨාශයේ තලාව ගම් ප්‍රදේශය වෙනස් කර නැවත විස්තර කිරීමට අදාලව පනවනු ලැබ, 1964 ජූනි මස 18 වැනි දින අංක 14,068 දරන අති විශෙෂ ගැසට් පත්‍රයෙහි පලකරන ලද ආඥවෙහි සඳහන් බෙදීම ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කරුණු සඳහා මීට යා කොට ඇති උපලේඛනයෙහි දක්වෙන ආකාරයෙන් විධිවිධාන මෙයින් සලස්වනු ලැබේ.

### උපලේඛනය

1. අළුත් ගම් ප්‍රදේශයේ ගම් සභාව, එකී අළුත් ගම් ප්‍රදේශයට අදාළ විය හැකි ගම් සභා ආඥපනතේ කාර්යයන් සඳහා පැරණි ගම් ප්‍රදේශයේ ගම් සභාවේ අනුප්‍රාප්තිකයා විය යුතුය.

2. පැරණි ගම් ප්‍රදේශයේ ගම් සභාව විසින් සම්පාදිතව 1965 ජනවාරි මස 31 වැනි දිනට වලංගුව පවත්නා සියලුම අතුරු ව්‍යවස්ථා එකී අළුත් ගම් සභාවට අදාළවන ප්‍රමාණයට එකී අළුත් ගම් ප්‍රදේශයෙහි වලංගුව පැවතිය යුතු අතර, එකී අතුරු ව්‍යවස්ථා එකී අළුත් ගම් ප්‍රදේශයේ ගම් සභාව විසින් සම්පාදිතව ඇතැයි සැලකිය යුතුය.

3. 1965 ජනවාරි මස 31 වැනි දිනට පැරණි ගම් ප්‍රදේශයේ ගම් සභාව වෙත පැවරී තිබෙන හෝ එහි පාලනය යටතේ පවතින එක් එක් ඉඩම, ගොඩනැගිල්ල හෝ අනිකුත් නිශ්චල දේපළ, ඒ ඉඩම, ගොඩනැගිල්ල හෝ අනිකුත් නිශ්චල දේපළ පිහිටා තිබෙන අළුත් ගම් ප්‍රදේශයේ ගම් සභාව වෙත 1965 පෙබරවාරි මස 1 වන දින සිට පැවරී ඇති ලෙස සැලකිය යුතුය.

4. පැරණි ගම් ප්‍රදේශයේ ගම් සභාවේ සියලුම අයිතිවාසිකම්, ණය තුරුස්, බැරකම් හා බැඳීම් අලුත් ගම් ප්‍රදේශයට අදාළ වන ප්‍රමාණයට 1965 පෙබරවාරි මස 1 වන දින සිට එකී අලුත් ගම් ප්‍රදේශයේ ගම් සභාවට පවරනු ලැබූ ලෙස සැලකිය යුතුය.

5. මෙම උපලේඛනයෙහි—

(අ) වෙනත් අන්දමකින් සඳහන් නොකරනු ලැබුවහොත් "අළුත් ගම් ප්‍රදේශය" යනුවෙන්, 1964 ජූනි මස 18 වැනි දින අංක 14,068 දරන අති විශෙෂ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද්දාවූද තලාව ගම් ප්‍රදේශයට අදාළ වන්නාවූද ආඥවෙන් වෙනස් කරනු ලැබ, නැවත විස්තර කරනු ලබන තලාව ගම් ප්‍රදේශය අදහස් වේ.

(ආ) අළුත් ගම් ප්‍රදේශය ඇතිවීමට පෙර පැවති තලාව ගම් ප්‍රදේශය "පැරණි ගම් ප්‍රදේශය" යනුවෙන් අදහස් වේ.

---

ඇල්. ඩී—බී 74/39

## ගම්සභා ආඥපනත

1961 අංක 60 දරන පනතින් සංශෝධිත (257 වැනි අධිකාරය වන) ගම් සභා ආඥපනතේ 5 (2) වැනි වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, පළාත් පාලනය හා ස්වදේශ කටයුතු පිළිබඳ ඇමතිවරයා විසින් පනවන ලද ආඥව.

ඒ. පී. ජයසූරිය,
පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ ඇමති.

1965 ජනවාරි මස 29 වැනි දින,
කොළඹ දී ය.

### ආඥව

දකුණු පළාතේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ නැගෙනහිර ගිරුවා පත්තුවේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ කණුකැටිය ගම් ප්‍රදේශය වෙනස් කර නැවත විස්තර කිරීමට අදාලව පනවනු ලැබ, 1964 ජූනි මස 18 වැනි දින අංක 14,068 දරන අති විශෙෂ ගැසට් පත්‍රයෙහි පළ කරනලද ආඥවෙහි සඳහන් බෙදීම ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කරුණු සඳහා මීට යා කොට ඇති උපලේඛනයෙහි දැක්වෙන ආකාරයෙන් විධිවිධාන මෙයින් සලස්වනු ලැබේ.

### උපලේඛනය

1. අලුත් ගම් ප්‍රදේශයේ ගම් සභාව එකී අලුත් ගම් ප්‍රදේශයට අදාලවිය හැකි ගම් සභා ආඥපනතේ කාර්යයන් සඳහා පැරණි ගම් ප්‍රදේශයේ ගම් සභාවේ අනුප්‍රාප්තිකයා විය යුතුය.

2. පැරණි ගම් ප්‍රදේශයේ ගම් සභාව විසින් සම්පාදිතව 1965 ජනවාරි මස 31 වැනි දිනට වලංගුව පවත්නා සියලුම අතුරු ව්‍යවස්ථා එකී අළුත් ගම් සභාවට අදාළ වන ප්‍රමාණයට එකී අලුත් ගම් ප්‍රදේශයෙහි වලංගුව පැවතිය යුතු අතර, එකී අතුරු ව්‍යවස්ථා එකී අලුත් ගම් ප්‍රදේශයේ ගම් සභාව විසින් සම්පාදිතව ඇතැයි සැලකිය යුතුය.

3. 1965 ජනවාරි මස 31 වැනි දිනට පැරණි ගම් ප්‍රදේශයේ ගම් සභාව වෙත පැවරී තිබෙන හෝ එහි පාලනය යටතේ පවතින එක් එක් ඉඩම, ගොඩනැගිල්ල හෝ අනිකුත් නිශ්චල දේපල ඒ ඉඩම, ගොඩනැගිල්ල හෝ අනිකුත් නිශ්චල දේපල පිහිටා තිබෙන අලුත් ගම් ප්‍රදේශයේ ගම් සභාව වෙත 1965 පෙබරවාරි මස 1 වැනි දින සිට පැවරී ඇති ලෙස සැලකිය යුතුය.

4. පැරණි ගම් ප්‍රද්ශයේ ගම් සභාවේ සියලුම අයිතිවාසිකම්, ණය තුරුස්, බැරකම් හා බැඳීම් අලුත් ගම් ප්‍රදේශයට අදාලවන ප්‍රමාණයට 1965 පෙබරවාරි මස 1 වැනි දින සිට එකී අලුත් ගම් ප්‍රදේශයේ ගම් සභාවට පවරනු ලැබූ ලෙස සැලකිය යුතු ය.

5. මෙම උපලේඛනයෙහි—

(අ) "අලුත් ගම් ප්‍රදේශය" යනුවෙන්, 1964 ජූනි මස 18 වැනි දින අංක 14,068 දරන අති විශෙෂ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද්දාවූද, කණුකැටිය ගම් ප්‍රදේශයට අදාළ වන්නාවූද ආඥවෙන් වෙනස් කරනු ලැබ, නැවත විස්තර කරනු ලබන කණුකැටිය ගම් ප්‍රදේශය අදහස් වේ.

(ආ) අලුත් ගම් ප්‍රදේශය ඇතිවීමට පෙර පැවැති කණුකැටිය ගම් ප්‍රදේශය "පැරණි ගම් ප්‍රදේශය" යනුවෙන් අදහස් වේ.

---

## ගම්සභා ආඥපනත

1961 අංක 60 දරන පනතින් සැශෝධිත (257 වැනි අධිකාරය වන) ගම්සභා අඥපනතේ 5 (2) වැනි වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර පළාත් පාලනය හා ස්වදේශ කටයුතු පිළිබඳ ඇමතිවරයා විසින් පනවන ලද ආඥව.

ඒ. පී. ජයසූරිය,
පළාත් පාලනය හා ස්වදේශ කටයුතු පිළිබඳ ඇමති.

1965 ජනවාරි මස 29 වැනි දින,
කොළඹ දී ය.

### ආඥව

දකුණු පළාතේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ දකුණු ගිරුවා පත්තුවේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ නෙටොල්පිටිය ගම් ප්‍රදේශය වෙනස් කර නැවත විස්තර කිරීමට අදැලව පනවනු ලැබ, 1964 ජූනි මස 18 වැනි දින අංක 14,068 දරන ගැසට් පත්‍රයේ පළකරන ලද ආඥවෙහි සඳහන් බෙදීම ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කරුණු සඳහා මීට යා කොට ඇති උපලේඛනයෙහි දැක්වෙන ආකාරයෙන් විධිවිධාන මෙයින් සලස්වනු ලැබේ.

### උපලේඛනය

1. අළුත් ගම් ප්‍රදේශයේ ගම් සභාව එකී අළුත් ගම් ප්‍රදේශයට අදාළ විය හැකි ගම් සභා ආඥපනතේ සියලුම කාර්යයන් සඳහා පැරණි ගම් ප්‍රදේශයේ ගම් සභාවේ අනුප්‍රාප්තිකයා විය යුතුය.

2. පැරණි ගම් ප්‍රදේශයේ ගම් සභාව විසින් සම්පාදිතව 1965 ජනවාරි මස 31 වැනි දිනට වලංගුව පවත්නා සියලුම අතුරු ව්‍යවස්ථා එකී අළුත් ගම් සභාවට අදාළ වන ප්‍රමාණයට එකී අළුත් ගම් ප්‍රදේශයෙහි වලංගුව පැවතිය යුතු අතර, එකී අතුරු ව්‍යවස්ථා එකී අළුත් ගම් ප්‍රදේශයේ ගම් සභාව විසින් සම්පාදිතව ඇතැයි සැලකිය යුතුය.

3. 1965 ජනවාරි මස 31 වැනි දිනට පැරණි ගම් ප්‍රදේශයේ ගම් සභාව වෙත පැවරී තිබෙන හෝ එහි පාලනය යටතේ පවතින එක් එක් ඉඩම, ගොඩනැගිල්ල හෝ අනිකුත් නිශ්චල දේපළ, ඒ ඉඩම, ගොඩනැගිල්ල හෝ අනිකුත් නිශ්චල දේපළ පිහිටා තිබෙන අළුත් ගම් ප්‍රදේශයේ ගම් සභාව වෙත 1965 පෙබරවාරි මස 1 වන දින සිට පැවරී ඇති ලෙස සැලකිය යුතුය.

4. පැරණි ගම් ප්‍රදේශයේ ගම් සභාවේ සියලුම අයිතිවාසිකම්, ණය තුරුස්, බැරකම් හා බැඳීම් අළුත් ගම් ප්‍රදේශයට අදාළ වන ප්‍රමාණයට 1965 පෙබරවාරි මස 1 වැනි දින සිට එකී අළුත් ගම් ප්‍රදේශයේ ගම්සභාවට පවරනු ලැබූ ලෙස සැලකිය යුතුය.

5. මෙම උපලේඛනයෙහි—

(අ) වෙනත් අන්දමකින් සඳහන් නොකරනු ලැබුවහොත්, "අළුත් ගම් ප්‍රදේශය" යනුවෙන්, 1964 ජූනි මස 18 වැනි දින අංක 14,068 දරන ගැසට් පත්‍රයෙහි පළ කරන ලද ආඥවෙන් විස්තර කර ඇති නෙටොල්පිටිය ගම් ප්‍රදේශය අදහස් වේ.

(ආ) අළුත් ගම් ප්‍රදේශය සංස්ථාපනය කරනු ලැබීමට පෙර පැවති නෙටොල්පිටිය ගම් ප්‍රදේශය "පැරණි ගම් ප්‍රදේශය" යනුවෙන් අදහස් වේ.

## ගම්සභා ආඥාපනත

1961 අංක 60 දරන පණතින් සංශෝධිත (257 වැනි අධිකාරය වන) ගම් සභා ආඥාපනතේ 5 (2) වැනි වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, පළාත් පාලනය හා ස්වදේශ කටයුතු පිළිබඳ ඇමතිවරයා විසින් පනවන ලද ආඥාවකි.

ඒ. පී. ජයසූරිය,
පළාත් පාලනය හා සවදේශ කටයුතු පිළිබඳ ඇමති.

1965 ජනවාරි මස 29 වැනි දින,
කොළඹ දී ය.

### ආඥාව

දකුණු පළාතේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ දකුණු ගිරුවා පත්තුවේ ප්‍රාදේශිය ආදායම් නිලධාරි කොට්ඨශයේ බෙලිඅත්ත ගම් ප්‍රදේශය වෙනස් කිරීම හා නැවත මායිම් නියම කිරීම සම්බන්ධයෙන් 1964 ජූනි මස 18 වැනි දින අංක 14,068 දරන ගැසට් පත්‍රයේ පළ කරන ලද ආඥාවේ සඳහන් බෙදීම ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කරුණු සඳහා මෙහි වූ උපලේඛනයේ දැක්වෙන ආකාරයෙන් විධිවිධාන මෙයින් සලස්වනු ලැබේ.

### උපලේඛනය

1. අලුත් ගම් ප්‍රදේශයට අදාළ විය හැකි ගම් සභා ආඥා පනතේ කාර්යයන් සඳහා අලුත් ගම් ප්‍රදේශයේ ගම් සභාව පැරණි ගම් ප්‍රදේශයේ ගම්සභාවේ අනුප්‍රාප්තිකයා විය යුතුය.

2. පැරණි ගම් ප්‍රදේශයේ ගම් සභාව විසින් සම්පාදිතව 1965 ජනවාරි මස 31 වෙනිදා වනතෙක් වලංගුව පවත්නා සියලුම අතුරු ව්‍යවස්ථා අලුත් ගම් ප්‍රදේශයට අදාළ වනතාක් එකී අළුත් ගම් ප්‍රදේශයේ වලංගුව පැවතිය යුතු අතර, මේ අතුරු ව්‍යවස්ථා එකී අලුත් ගම් ප්‍රදේශයේ ගම් සභාව විසින් සම්පාදිත ලෙස සැලකිය යුතුය.

3. 1965 ජනවාරි මස 31 වැනි දින වන විට පැරණි ගම් ප්‍රදේශයේ ගම්සභාව වෙත පැවරී තිබෙන හෝ එහි පාලනය යටතේ පවතින එක් එක් ඉඩම, ගොඩනැගිල්ල හෝ සෙසු නිශ්චල දේපළ, 1965 පෙබරවාරි මස 1 වැනි දින සිට එකී ඉඩම, ගොඩනැගිල්ල හෝ සෙසු නිශ්චල දේපළ පිහිටා තිබෙන අලුත් ගම් ප්‍රදේශයේ ගම්සභාව වෙත පැවරී ඇති ලෙස සැලකිය යුතුය.

4. පැරණි ගම් ප්‍රදේශයේ ගම් සභාවේ සියලුම අයිතිවාසිකම්, ණය බැරකම් හා බැඳීම් අලුත් ගම් ප්‍රදේශයේ ගම්සභාවට අදාළ වන තාක් ඒවා 1965 පෙබරවාරි මස 1 වැනි දින සිට අලුත් ගම් ප්‍රදේශයේ ගම් සභාවට මාරු කරනු ලැබූ ලෙස සැලකිය යුතුය.

5. මෙම උපලේඛනයෙහි :—

(අ) වෙනත් අන්දමකින් නියම කරනු නොලැබුවහොත් "අලුත් ගම් ප්‍රදේශය" යන්නෙන් 1964 ජූනි මස 18 වැනි දින 14,068 දරන ගැසට් පත්‍රයේ පළ කරන ලද ආඥාවෙහි වූ උපලේඛනයෙහි විස්තර කර ඇති බෙලිඅත්ත ගම් ප්‍රදේශය අදහස් කෙරේ.

(ආ) "පැරණි ගම් ප්‍රදේශය" යන්නෙන් අලුත් ගම් ප්‍රදේශය ඇති වීමට පෙර පැවති බෙලිඅත්ත ගම් ප්‍රදේශය අදහස් වේ.

---

## ගම්සභා ආඥාපනත

1961 අංක 60 දරණ පනතින් සංශෝධිත (257 අධිකාරය වන) ගම් සභා ආඥාපනතේ 5 (2) වන වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර පළාත් පාලනය හා ස්වදේශ කටයුතු පිළිබඳ ඇමතිවරයා විසින් පනවන ලද ආඥාව.

ඒ. පී. ජයසූරිය,
පළාත් පාලනය හා ස්වදේශ කටයුතු පිළිබඳ ඇමති.

1965 ජනවාරි මස 29 වැනි දින,
කොළඹදීය.

### ආඥාව

දකුණු පළාතේ මාතර දිස්ත්‍රික්කයේ වැල්ලබඩ පත්තුවේ ප්‍රාදේශිය ආදායම් නිලධාරි කොට්ඨාශයේ කැකැණඳුර ගම් ප්‍රදේශය වෙනස් කර නැවත විස්තර කිරීමට අදාළව 1964 ජූලි 17 වැනි දින අංක 14,108 දරන ගැසට් පත්‍රයේ පලකරනලද ආඥාවේ සඳහන් බෙදාවෙන් කිරීම ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කරුණු සඳහා, මීට යාකොට ඇති උපලේඛනයේ දැක්වෙන ආකාරයෙන් විධිවිධාන මෙයින් සලස්වනු ලැබේ.

### උපලේඛනය

එක් එක් අලුත් ගම් ප්‍රදේශයේ ගම් සභාව, ඒ අලුත් ගම් ප්‍රදේශයට අදාළ විය හැකි ගම් සභා ආඥාපනතේ සියළුම කාර්යයන් සඳහා පැරණි ගම් ප්‍රදේශයේ ගම් සභාවේ අනුප්‍රාප්තික සභාව විය යුතුය.

2. පැරණි ගම් ප්‍රදේශයේ ගම්සභාව විසින් සම්පාදිතව 1965 ජනවාරි මස 31 වැනි දින වලංගුව පවත්නා සියළුම අතුරු ව්‍යවස්ථා ඒ අලුත් ගම්සභාවට අදාළවන ප්‍රමාණයට ඒ එක් එක් අලුත් ගම් ප්‍රදේශයේ වලංගුව පැවතිය යුතු අතර ඒ අතුරු ව්‍යවස්ථා ඒ අලුත් ගම් ප්‍රදේශයේ ගම් සභාව විසින් සම්පාදිත ලෙස සැලකිය යුතුය.

3. 1965 ජනවාරි 31 වැනි දින, පැරණි ගම් ප්‍රදේශයේ ගම්සභාව කෙරෙහි පැවරී තිබෙන හෝ එහි පාලනය යටතේ පවතින පහත සඳහන් චංචල දේපල, 1965 පෙබරවාරි 1 වන දින සිට අපරැක්ක-බඹරැන්ද අලුත් ගම් ප්‍රදේශයේ ගම්සභාව කෙරෙහි පැවරෙන ලෙස සැලකිය යුතු අතර, පැරණි ගම් ප්‍රදේශයේ ගම් සභාවේ ඉතිරි චංචල දේපළ කැකැණඳුර අලුත් ගම් ප්‍රදේශයේ ගම්සභාව කෙරෙහි පැවරෙන ලෙස සැලකිය යුතුය.

| | | | |
|---|---|---|---|
| පයිලිං කැබිනට් | ... | ... | 1 යි |
| ලොකු ලියන මේස | ... | ... | 1 යි |
| කුෂන් කරන ලද පුටු | ... | ... | 13 යි |
| කුඩා ලියන මේස | ... | ... | 1 යි |
| ඇඳි පුටු | ... | ... | 1 යි |
| පුටු | ... | ... | 4 යි |
| යතුරු ලියන (ඉංග්‍රීසි) | ... | ... | 1 යි |
| එම ස්ටැන්ඩ් | ... | ... | 1 යි |
| පිජන් හෝල් ස්ටැන්ඩ් | | ... | 1 යි |
| කඩදාසි බන්දේසි (වයර්) | | ... | 1 යි |
| ,, බර | ... | ... | 1 යි |
| සීනු | ... | ... | 1 යි |
| පන්චර් | ... | ... | 1 යි |
| තීන්ත කුඩු | ... | ... | 1 යි |
| රූල් ලී | ... | ... | 1 යි |
| පෙන් රැක් | ... | ... | 1 යි |
| සීල් ස්ටෑන්ඩ් | ... | ... | 1 යි |
| පොත් තබන රාක්ක | ... | ... | 1 යි |
| ශබ්ද කෝෂ | ... | ... | 1 යි |
| කුණු කූඩා | ... | ... | 1 යි |
| නාම පුවරු | ... | ... | 5 යි |
| ස්ටූල් | ... | ... | 1 යි |
| කොඩි | ... | ... | 1 යි |
| කුඩා පිහිය | ... | ... | 1 යි |
| මේස | ... | ... | 1 යි |
| ස්ටෙප්ලිං මැෂින් | ... | ... | 1 යි |
| ඇෂ්ට්රේ | ... | ... | 1 යි |
| අල්මාරි | ... | ... | 1 යි |
| පිකැස් | ... | ... | 2 යි |
| අලවංගු | ... | ... | 1 යි |
| වීදුරු | ... | ... | 5 යි |
| උදළු | ... | ... | 6 යි |
| ස්ටොක් බකට් | ... | ... | 1 යි |
| කැති | ... | ... | 1 යි |

අපරැක්ක බඹරැන්ද ගම් ප්‍රදේශයේ අපරැක්කේ සහ නාඔටුන්නේ පිහිටුවා ඇති මාතෘදරකාභිවෘධි චිකිත්සාගාරවල ඇති සියළුම චංචල දේපල ඒ අළුත් ගම්සභා ප්‍රදේශයේ ගම්සභාව කෙරෙහි පැවරිය යුතුය.

4. පැරණි ගම් ප්‍රදේශයේ ගම්සභාව කෙරෙහි 1965 ජනවාරි 31 වැනි දින පැවරී තිබෙන හෝ එහි පාලනය යටතේ පවතින එක් එක් ඉඩම, ගොඩනැගිල්ල හෝ අනිකුත් නිශ්චල දේපල, ඒ ඉඩම, ගොඩනැගිල්ල, හෝ අනිකුත් නිශ්චල දේපළ පිහිටා තිබෙන අලුත් ගම් ප්‍රදේශයේ ගම්සභාව කෙරෙහි 1965 පෙබරවාරි 1 වැනි දින සිට පැවරී ඇති ලෙස සැලකිය යුතුය.

5. පැරණි ගම් ප්‍රදේශයේ ගම් සභාවේ සියළුම අයිතිවාසිකම්, ණය තුරුස්, වගකීම් හා බැඳීම්, එක් එක් අලුත් ගම් ප්‍රදේශයේ ගම් සභාවට අදාළවන ප්‍රමාණයට ඒවා 1965 පෙබරවාරි මස 1 දින සිට ඒ අලුත් ගම් ප්‍රදේශයේ ගම්සභාවට මාරු කරනු ලැබූ ලෙස සැලකිය යුතුය.

6. පැරණි ගම් ප්‍රදේශයේ ගම්සභා කාර්‍යාලයේ පවත්වාගෙන යනු ලැබූ සියළුම ලිපි ගොනු හා ලේඛන, ඒවා එක් එක් අලුත් ගම් ප්‍රදේශයට අදාළ ප්‍රමාණයට 1965 පෙබරවාරි 1 වැනි දින සිට ඒ අලුත් ගම් ප්‍රදේශයේ ගම්සභා කාර්‍යාලයට මාරු කරනු ලැබූ ලෙස සැලකිය යුතුය.

7. පැරණි ගම්සභාවේ සේවයේ නියුක්තව සිටියාවූද දැනට සිටින්නාවූද සේවකයිනට විශ්‍රාම වැටුප් ගෙවීම පිණිසවූ දායක මුදල් ගෙවීම පිළිබඳ ඊට ඇති වගකීම් පහත සඳහන් ආකාරයෙන් බෙදිය යුතුය :—

(අ) පැරණි ගම් සභාව විසින් දැනට ගෙවනු ලබන විශ්‍රාම වැටුප් සම්බන්ධයෙන් අපරැක්ක-බඹරැන්ද හා කැකණදුර යන අලුත් ගම්සභා අතරේ 1 : 1 සමානුපාතයෙන්.

(ආ) පැරණි ගම්සභාවේ කලින් සේවය කොට දැනට පිටතට මාරු කර ඇත්තාවූ සේවකයින්ට ගෙවිය යුතු විශ්‍රාම වැටුප් සම්බන්ධයෙන් අපරැක්ක-බඹරැන්ද හා කැකණදුර යන අලුත් ගම්සභා අතරේ 1 : 1 සමානුපාතයෙන්.

(ඇ) පැරණි ගම් සභාවේ දැනට සේවයේ නියුක්තව සිටින්නාවූ සේවකයින්ගේ විශ්‍රාම වැටුප් සම්බන්ධයෙන් අපරැක්ක-බඹරැන්ද හා කැකණදුර යන අළුත් ගම්සභා අතරේ 1 :1 සමානුපාතයෙන්.

8. මේ උපලේඛනයේ—

(අ) වෙනත් අන්දමකින් සඳහන් කලොත් මිස "අළුත් ගම් ප්‍රදේශය" යනුවෙන් 1964 ජූලි 17 වැනි දින අංක 14,108 දරන ගැසට් පත්‍රයේ පලකරනලද ආඥාවෙන් වෙනස්කර නැවත විස්තර කරනු ලැබූ අපරැක්ක-බඹරැන්ද ගම් ප්‍රදේශය හෝ කැකණදුර ගම් ප්‍රදේශය අවස්ථාවෝචිත පරිදි අදහස් කරනු ලැබේ.

(ආ) "පැරණි ගම් ප්‍රදේශය" යනුවෙන් අලුත් ගම් ප්‍රදේශය ඇතිවීමට පෙර පැවති කැකැණදුර ගම් සභා ප්‍රදේශය අදහස් කරනු ලැබේ.

---

## ගම්සභා ආඥාපනත

1961 අංක 60 දරන පණතින් සංශෝධිත (257 වැනි අධිකාරය වන) ගම්සභා ආඥාපනතේ 5 (2) වැනි වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර පළාත් පාලනය හා ස්වදේශ කටයුතු පිළිබඳ ඇමතිවරයා විසින් පනවන ලද ආඥාවකි.

ඒ. පී. ජයසූරිය,
පළාත් පාලනය හා ස්වදේශ කටයුතු පිළිබඳ ඇමති.

1965 ජනවාරි මස 29 වැනි දින,
කොළඹ දී ය.

### ආඥාව

දකුණු පළාතේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ උතුරු ගිරුවා පත්තුවේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ වලස්මුල්ල ගම් ප්‍රදේශය වෙනස් කිරීම හා නැවත මායිම් නියම කිරීම සම්බන්ධයෙන් 1964 ජූනි මස 18 වැනි දින අංක 14,068 දරන ගැසට් පත්‍රයේ පළ කරනලද ආඥාවේ සඳහන් බෙදීම ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කරුණු සඳහා මෙහි වූ උපලේඛනයේ දැක්වෙන ආකාරයෙන් විධිවිධාන මෙයින් සලස්වනු ලැබේ.

### උපලේඛනය

1. අලුත් ගම් ප්‍රදේශයට අදාළ විය හැකි ගම්සභා ආඥාපනතේ කාර්යන් සඳහා අලුත් ගම්ප්‍රදේශයේ ගම් සභාව පැරණි ගම් ප්‍රදේශයේ ගම්සභාවේ අනුප්‍රාප්තිකයා විය යුතුය.

2. පැරණි ගම් ප්‍රදේශයේ ගම් සභාව විසින් සම්පාදිතව 1965 ජනවාරි මස 31 වැනිදා වන තෙක් වලංගුව පවත්නා සියළුම අතුරු ව්‍යවස්ථා අලුත් ගම් ප්‍රදේශයට අදාළ වනතාක් එකී අලුත් ගම් ප්‍රදේශයේ වලංගුව පැවතිය යුතු අතර, මේ අතුරු ව්‍යවස්ථා එකී අලුත් ගම් ප්‍රදේශයේ ගම්සභාව විසින් සම්පාදිත ලෙස සැලකිය යුතුය.

3. 1965 ජනවාරි මස 31 වැනි දින වන විට පැරණි ගම් ප්‍රදේශයේ ගම්සභාව වෙත පැවරී තිබෙන හෝ එහි පාලනය යටතේ පවතින එක් එක් ඉඩම, ගොඩනැගිල්ල හෝ සෙසු නිශ්චල දේපළ, 1965 පෙබරවාරි මස 1 වැනි දින සිට එකී ඉඩම, ගොඩනැගිල්ල හෝ සෙසු නිශ්චල දේපළ පිහිටා තිබෙන අලුත් ගම් ප්‍රදේශයේ ගම්සභාව වෙත පැවරී ඇති ලෙස සැලකිය යුතුය.

4. පැරණි ගම් ප්‍රදේශයේ ගම් සභාවේ සියලුම අයිතිවාසිකම්, ණය, බැරකම් හා බැඳීම් අලුත් ගම් ප්‍රදේශයේ ගම්සභාවට අදාළ වනතාක්, ඒවා 1965 පෙබරවාරි මස 1 වැනි දින සිට අලුත් ගම් ප්‍රදේශයේ ගම්සභාවට මාරු කරනු ලැබූ ලෙස සැලකිය යුතුය.

5. මෙම උපලේඛනයෙහි—

(අ) වෙනත් අන්දමකින් නියම කරනු නොලැබුවහොත් "අලුත් ගම් ප්‍රදේශය" යන්නෙන් 1964 ජූනි මස 18 වැනි දින අංක 14,068 දරන ගැසට් පත්‍රයේ පළ කරන ලද ආඥාවෙහි වූ උපලේඛනයේ විස්තර කර ඇති වලස්මුල්ල ගම් ප්‍රදේශය අදහස් කෙරේ.

(ආ) "පැරණි ගම් ප්‍රදේශය" යන්නෙන් අලුත් ගම් ප්‍රදේශය ඇතිවීමට පෙර පැවති වලස්මුල්ල ගම් ප්‍රදේශය අදහස් වේ.

---

ඇල්.ජී.—බී. 9/64 (57)

ප.පා.දෙ.—ජී.අයි. 10/1

## ගම්සභා ආඥාපනත

1961 අංක 60 දරන පනතින් සංශෝධිත (257 වන අධිකාරය වන) ගම්සභා ආඥාපනතේ 5 වැනි හා 10 වැනි වගන්තිවලින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, පළාත් පාලනය හා සවදේශ කටයුතු පිළිබඳ ඇමැති ඇලෙක්සැන්ඩර් පෙරේරා ජයසූරිය වන මම, මාතලේ දිස්ත්‍රික්කයේ රත්තොට ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ මාතලේ පල්ලේසිය පත්තු නැගෙනහිර අළුත් ගම් ප්‍රදේශය සංස්ථාපනය කිරීමට අදාළව 1964 ජූලි 20 වන දින අංක 14,113 දරන අති විශෙෂ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද නිවේදනය, ඊට යාකොට ඇති උපලේඛනය වෙනුවට මීට යාකොට ඇති උපලේඛනය ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරමි.

ඒ. පී. ජයසූරිය,
පළාත් පාලනය හා සවදේශ කටයුතු පිළිබඳ ඇමති.

1965 ජනවාරි 27 වැනි දින,
කොළඹ දීය.

### උපලේඛනය

පහත සඳහන් ප්‍රදේශවලින් සමන්විත මාතලේ පල්ලේසිය පත්තු නැගෙනහිර ගම් ප්‍රදේශය :—

(373) පල්ලේගම ග්‍රාමසේවක කොට්ඨාශය තුළට වැටී ඇති කයිකාවල වත්තේ, කොස්වානවත්තේ සහ ඕවිල වත්තේ කොටස් හැර එකී ග්‍රාමසේවක කොට්ඨාශය. (374) උඩගම ග්‍රාමසේවක කොට්ඨාශය. (375) මාඋස්සාගොල්ල ග්‍රාමසේවක කොට්ඨාශය. (375ඒ) බෝදිකොටුව ග්‍රාමසේවක කොට්ඨාශය. (376) රත්තොට-නිකවැල්ල ග්‍රාමසේවක කොට්ඨාශය. (378) දන්කන්ද ග්‍රාමසේවක කොට්ඨාශය.

ඇල්.ඞී.—බී. 9/64 (57)
ප.පා.දෙ.—ජී.අයි. 10/1

## ගම්සභා ආඥාපනත

1961 අංක 60 දරන පනතින් සංශෝධිත (257 වැනි අධිකාරය වන) ගම්සභා ආඥාපනතේ 5 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර පළාත් පාලනය හා ස්වදේශ කටයුතු පිළිබඳ ඇමති ඇලෙක්සැන්ඩර් පෙරේරා ජයසූරිය වන මම, මාතලේ දිස්ත්‍රික්කයේ රත්තොට ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ මාතලේ පල්ලේසිය පත්තු ගම් ප්‍රදේශය වෙනස් කිරීමට හා නැවත විස්තර කිරීමට අදාළව 1964 ජූලි 20 වෙනි දින අංක 14,113 දරන අති විශෙෂ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද නිවේදනය, ඊට යාකොට ඇති උපලේඛනය වෙනුවට මීට යාකොට ඇති උපලේඛනය ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරමි.

ඒ. පී. ජයසූරිය,
පළාත් පාලනය හා ස්වදේශ කටයුතු පිළිබඳ
ඇමති.

1965 ජනවාරි 29 වැනි දින,
කොළඹ.

### උපලේඛනය

පහත සඳහන් ග්‍රාමසේවක කොට්ඨාශවලින් සමන්විත මුළු බිම් ප්‍රදේශය :—

(1) පල්ලෙගම ග්‍රාමසේවක කොට්ඨාශයේ (373) ඇතුළතට වැටී ඇති කයිකාවල වත්තේ, කොස්වාන වත්තේ හා ඕවලවත්තේ කොටස් හැර ඒ ග්‍රාමසේවක කොට්ඨාශය.

(2) උඩගම ග්‍රාමසේවක කොට්ඨාශය (374).

(3) මාඋස්සාගොල්ල ග්‍රාමසේවක කොට්ඨාශය (375).

(4) බෝධිකොටුව ග්‍රාමසේවක කොට්ඨාශය (375ඒ).

(5) රත්තොට-නිකවැල්ල ග්‍රාමසේවක කොට්ඨාශය (376).

(6) දන්කන්ද ග්‍රාමසේවක කොට්ඨාශය (378).

ලංකාවේ වාලච්චේනයෙහි පිහිටි "ඊස්ටර්න් පේපර් මිල්ස් කෝපරේෂන්" හි නිපදවන ලද කඩදාසිවල
ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රාපිතයි